# GOVERNMENT INTERVENTIONS TO THE MARKET (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# <u>බදු පැනවීම</u>

සැපයුම්කරුවන් සහ ගැනුම්කරුවන් මත බදු පැනවීම, ආණ්ඩුවක් විසින් වෙළෙඳපොළ ක්‍රියාවලියට මැදිහත් වන සුලබ ම අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

## <u>භාණ්ඩ මත පනවනු ලබන බදු අනුපාතිකවල ස්වරූප දෙකකි</u>

- ප්‍රතිශතක බද්ද
- ඒකක බද්ද

ClassWork.LK

## <u>ප්‍රතිශතක බද්ද</u>

නිෂ්පාදනය හෝ පරිභෝජනය හෝ කරන භාණ්ඩයේ වටිනාකම මත කිසියම් ප්‍රතිශතයක් බදු වශයෙන් අය කර ගැනීම ප්‍රතිශතක බද්දක් වශයෙන් හඳුන්වයි.

**නිදසුන**

සීනි කිලෝග්‍රෑම් 1 ක වටිනාකම මත 2% ක බද්දක් පැනවීම

## <u>ඒකක බද්ද</u>

නිෂ්පාදනය හෝ පරිභෝජනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් මත කිසියම් රුපියල් ප්‍රමාණයක් බදු වශයෙන් අයකර ගැනීම ඒකක බද්දක් පැනවීම යන්නෙන් අදහස් වේ. මෙය නිශ්චිත බද්දකි.

**නිදසුන්**

- සීනි කිලෝග්‍රෑම් එකක් සඳහා රුපියල් 10/-ක් බදු අය කිරීම
- පාන් රාත්තලකට රුපියල් 2/- ක බද්දක් අය කිරීම
- රෙදි මීටරයකට රුපියල් 3/- ක් බදු අය කිරීම

ClassWork.LK

# සැපයුම්කරු මත ඒකක බදු පැනවීම

සැපයුම්කරු මත ඒකක බදු පැනවීමේ නිසා සිදු වන්නේ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම යි.

මේ නිසා සැපයුමෙහි අඩු වීමක් සිදු වන අතර, බද්දේ ප්‍රමාණයෙන් සැපයුම් වක්‍රය වමට විතැන් වීමක් ද සිදු වේ.

මෙලෙසින් ඒකක බද්දක් පැනවීම නිසා වෙළෙඳපොළ සමතුලිතයට වන බලපෑම ලේඛන, ප්‍රස්තාර හා සමීකරණ මගින් පෙන්නුම් කළ හැකි ය.

සැපයුම්කරු මත ඒකක බද්දක් පැනවූ විට එම බද්ද සැපයුම් ලේඛනයට, සැපයුම් වක්‍රයට සහ සැපයුම් සමීකරණයට පහත ලෙස ගැළපිය හැකි ය.

ClassWork.LK

## සැපයුම්කරු මත ඒකක බද්දක් පැනවූ විට එම බද්ද සැපයුම් ලේඛනයට කරන බලපෑම

තරගකාරී භාණ්ඩ වෙළෙඳපොළක කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් හා සැපයුම් ලේඛනය පහත දැක්වේ.

| **මිල (රු)** | **සැපයුම් ප්‍රමාණය (ඒකක)** |
|---|---|
| 0 | 0 |
| 5 | 10 |
| 10 | 20 |
| 15 | 30 |
| 20 | 40 |
| 25 | 50 |
| 30 | 60 |
| 35 | 70 |
| 40 | 80 |

ආණ්ඩුව මෙම භාණ්ඩයේ සෑම විකුණුම් ඒකකයකින් ම රුපියල් 5.00 ක බද්දක් අය කරයි. මේ නිසා වෙළෙඳපොළ නව සැපයුම් ලේඛනය පහත පරිදි වේ.

ClassWork.LK


| මිල (රු) | ඒකක බද්ද (රු) | බද්දෙන් පසු මිල (රු) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|---|
| 0 | 5 | 5 | 0 |
| 5 | 5 | 10 | 10 |
| 10 | 5 | 15 | 20 |
| 15 | 5 | 20 | 30 |
| 20 | 5 | 25 | 40 |
| 25 | 5 | 30 | 50 |
| 30 | 5 | 35 | 60 |
| 35 | 5 | 40 | 70 |
| 40 | 5 | 45 | 80 |

ඒකක බද්ද නිෂ්පාදකයාට පිරිවැයක් වන බැවින් බද්ද පැනවීම නිසා සැපයුම් ප්‍රමාණය අඩු වී ඇති බව ඉහත වගු සටහනෙන් පැහැදිලි වේ.

ClassWork.LK

<u>**සැපයුම්කරු මත ඒකක බද්දක් පැනවූ විට එම බද්ද සැපයුම් වක්‍රයට කරන බලපෑම**</u>

ඒකක බද්ද පැනවීමට පෙර ඉල්ලුම් සහ සැපයුම් තොරතුරු සහ බද්ද පැනවීම නිසා නව සැපයුම් වක්‍රය / සැපයුම අඩු වීම දක්වෙන ආකාරය පිළිබඳ තොරතුරු පහත පරිදි ප්‍රස්තාර සටහනක් මගින් දක්විය හැකි ය.




නිෂ්පාදකයන් මත රුපියල් 5ක ඒකක බද්ද පැනවීම නිසා සැපයුම් වක්‍රය S-S1 දක්වා වමට විතැන් වී ඇති අතර සමතුලිතය ද වෙනස් වී ඇත.

ClassWork.LK

එනම් ,

**බද්දට පෙර,**

සමතුලිත මිල = රු. 20.00

සමතුලිත ප්‍රමාණය = ඒකක 40

**බද්දට පසු,**

සමතුලිත මිල = රු. 22.50

සමතුලිත ප්‍රමාණය = ඒකක 35


ClassWork.LK

## බදු පැනවීම නිසා ඇතිවන ශුභසාධන ප්‍රතිපාකය

නිෂ්පාදකයන් මත ඒකක බදු පැනවීම නිසා සමතුලිතය වෙනස් වීමට අමතර ව ශුභසාධන ප්‍රතිපාකයන් ද හට ගනී.

ClassWork.LK

පහත ප්‍රස්තාර සටහන මගින් එම **ශුභසාධන ප්‍රතිවිපාකයන්** හඳුනා ගත හැකි ය.




ClassWork.LK

## බද්දට පෙර

පාරිභෝගික අතිරික්තය = A + B + C + D

පාරිභෝගික අතිරික්තය = $\frac{\text{(සමතුලිත මිල) x සමතුලිත ප්‍රමාණය}}{2}$

$$= \frac{(40 - 20) \times 40}{2}$$

= රු. 400 /=

නිෂ්පාදන අතිරික්තය = $H + G + F + 1 + J$

= $\frac{\text{(සමතුලිත මිල- අවම සැපයුම් මිල) x සමතුලිත ප්‍රමාණය}}{2}$

$$= \frac{(20 - 0) \times 40}{2}$$

= රු. 400 /=

ආර්ථික අතිරික්තය = $(A + B + C + D) + H + G + F + 1 + J$

= රු. 400 + රු. 400

= රු. 800 / -

ClassWork.LK

## බද්දට පසු

පාරිභෝගික අතිරික්තය = A

= (උපරිම සිල්ලර මිල - නව සමතුලිත මිල x නව සමතුලිත ප්‍රමාණය
2

$$= \frac{(40 - 22.50) \times 35}{2}$$

= රු. 306.25

නිෂ්පාදන අතිරික්තය = *1 + J*

= (නිෂ්පාදකයාට ලැබෙන මිල - අවම සැපයුම් මිල) x නව සමතුලිත ප්‍රමාණය
2

$$= \frac{(17.50 - 0) \times 35}{2}$$

= රු. 306.25 /=

ආර්ථික අතිරික්තය = (A) + (1 + J)

= 306.25 + 306.25

= රු. 612.50 / -

ClassWork LK

බද්ද නිසා පාරිභෝගික අතිරික්තයේ වූ අහිමි වීම

= (A+ B + C + D ) - A

= B + C + D

= 400 - 306.25

= රු. 93.75 / -

බද්ද නිසා නිෂ්පාදන අතිරික්තයේ වූ අහිමි වීම

= $B + C + D + H + G + F$

= 400 - 306.25

= රු. 93.75 / -

බද්ද නිසා අහිමි වූ ආර්ථික අතිරික්තය

= බද්දට පෙර ආර්ථික අතිරික්තය - බද්දට පසු ආර්ථික අතිරික්තය

= 800 - 612.50

= රු. 187.50 //

ClassWork.LK

## <u>ඒකක බද්දෙන් රජයට ලැබෙන ආදායම</u>

= $B + C + H + G$

= ඒකක බද්දේ ප්‍රමාණය x නව සමතුලිත ප්‍රමාණය

= රු. 5 x 35

= රු. 175 / =

ClassWork.LK

## ඒකක බද්දෙන් පාරිභෝගිකයා දරන ප්‍රමාණය

= බද්දට පෙර සමතුලිත මිල - බද්දට පසු සමතුලිත මිල

= රු. 20. 00 - රු. 22.50

= රු. 2.50 / =

පාරිභෝගිකයා දරන බදු බර = *B + C*

= 2.50 x 35

= රු. 87.50 / =

## ඒකක බද්දෙන් නිෂ්පාදකයා දරන ප්‍රමාණය

= සමතුලිත මිල - නිෂ්පාදකයාට ලැබෙන මිල

= 20. 00 - 17.50

= රු. 2.50 / =

නිෂ්පාදකයාගේ බදු බර = *H + G*

= 2.50 x 35

= රු. 87.50 / =

ClassWork.LK

## පාරිභෝගිකයා හා නිෂ්පාදකයා යන දෙදෙනාගේ ම බදු බර

$= B + C + H + G$

$= 87.50 \text{ x } 87.50$

= රු. 175 / =

ඒකක බද්දෙන් රජයට ලැබෙන ආදායම නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා දෙදෙනාගේ ම බදු බරෙහි එකතුවට සමාන වේ.

ඒකක බද්ද නිසා සමස්ත සමාජයට වූ බලපෑම = රජයේ ආදායම - ආර්ථික අතිරික්තයේ අහිමි වීම

= 175 - 187.50

= රු. 12.50

ඒකක බද්ද නිසා සමස්ත සමාජයට රු. 12.50 ක අහිමි වීමක් සිදු ව ඇත.

ClassWork.LK

ශුභසාධනයේ අහිමිවීම D + F ක්ෂේත්‍රඵලයට සමාන වේ. එනම්,

රජයේ ආදායම - ආර්ථික අතිරික්තයේ වූ අහිමි වීම

$$B + C + H + G - (B + C + D) + (H + G + F)$$
$$B + C + H + G - B - C - D - H - G - F$$

ශුභසාධනයේ අහිමිවීම පහත පරිදිද ගණනය කළ හැකිය.

$$= \frac{(\text{ඒකක බද්ද x සමතුලිත ප්‍රමාණයේ වෙනස})}{2}$$

$$= \frac{5 \times 5}{2} = \text{රු. } 12.50//$$

ClassWork.LK

## සැපයුම්කරු මත ඒකක බද්දක් පැනවූ විට එම බද්දෙහි ආර්ථික ප්‍රතිවිපාක සමීකරණ භාවිතයෙන් සොයා බැලීම

ඉහත සැලකිල්ලට ගත් නිදසුනට අනුව ඒකක බදු පැනවීමට පෙර ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහත පරිදි වේ.

$$Qd = 80 - 2p$$
$$Qs = 0 + 2p$$

මේ නිසා බද්දට පෙර, සමතුලිතය,

$Qd - Qs$

$80 - 2p = 0 + 2P$

$80 = 4P$

$20 = P$

**P = 20** ඉල්ලුම් සමීකරණයට ආදේශයෙන්,

$80 - 2x20$

$=40$

සමතුලිත = මිල රුපියල් 20//

සමතුලිත = රුපියල් 40//

ClassWork.LK

නිෂ්පාදකයන්ගෙන් ඒකක බදු පැනවීම නිෂ්පාදකයාට පිරිවැයක් වේ. ඒ බව සැපයුම් සමීකරණ මගින් පහත ලෙස දැක්විය හැකි ය.

$Qs = 0 + 2\ (p - t)$

$Qs = 2\ (p - 5)$

$Qs = 2p - 10$

$Qs = -10 + 2p$

නව සැපයුම් සමීකරණය $Qs = -10 + 2p$

බද්දට පසු නව සමතුලිතය,

$Qd = Qs$

$80 - 2p = - 10 + 2p$

$90 = 4p$

$22.50 = p$

P = 22.50, සැපයුම් සමීකරණයට ආදේශයෙන් නව සමතුලිත ප්‍රමාණය,

Qs = 10 + 2 (22.50)

<u>Qs = 35</u>

ClassWork.LK

බද්දට පසු සමතුලිත මිල = රු. 22.50
බද්දට පසු සමතුලිත ප්‍රමාණය = ඒකක 35//

නිෂ්පාදකයන් මත ඒකක බදු පැනවීම නිසා ඇති වන අනෙකුත් ප්‍රතිවිපාකද ඉල්ලුම් සැපයුම් සමීකරණ මගින් දැක්විය හැකි ය.

ClassWork.LK

# ගැනුම්කරුවන් මත ඒකක බදු පැනවීම

ගැනුම්කරුවන් මත ඒකක බදු පැනවීම යන්නෙන් අදහස් වන්නේ භාණ්ඩයක් මිලදී ගන්නා අවස්ථාවේ දී ඒකකයක් මත නිශ්චිත රුපියල් ප්‍රමාණයක් ගැනුම්කරුගෙන් බදු ලෙස අය කිරීමයි.

**නිදසුන් :-**

විකුණුම් බදු, පාරිභෝගික වැට් බදු

මෙහි දී භාණ්ඩයක් මිල දී ගන්නා අවස්ථාවේ දී අය කරන හෙයින් නෛතික වශයෙන් බද්ද මුළුමනින්ම ගෙවනු ලබන්නේ ගැනුම්කරු ය.

**නිදසුන :-**

දොඩම් ගෙඩියක් මත රු. 10 ක අලෙවි බද්දක් අය කරනු ලබයි නම් දොඩම් මිලදී ගන්නා සෑම අවස්ථාවක දී ම දොඩම් ගෙඩියකට රු. 10 බැගින් බද්දක් ආණ්ඩුවට ගෙවිය යුතු ය.


ClassWork.LK

ගැනුම්කරුවන් මත ඒකක බද්දක් පැනවූ විට එම භාණ්ඩයේ සැපයුම් වක්‍රයට කිසිඳු බලපෑමක් ඇති නොවේ.

එහෙත් ගැනුම්කරුවන් මත ඒකක බදු පැනවූ විට ගැනුම්කරුවන් ගෙවිය යුතු මිල ඉහළ යන බැවින් ගැනුම්කරුවන් මිල දී ගත් ඒකක සඳහා බද්දෙන් පසු ගෙවීමට කැමති මිල අඩුවේ. මේ නිසා පැවති මිල ගණන් යටතේම බද්දේ ප්‍රමාණයෙන් **ඉල්ලුම් වක්‍රය** වමට විතැන් වේ.

ClassWork.LK

# ගැනුම්කරු මත ඒකක බද්දක් පැන වූ පසු සමතුලිතය වෙනස් වන ආකාරය




ඉහත රූප සටහනට අනුව ගැනුම්කරු මත ඒකක බද්ද පැනවීමට පෙර සමතුලිතය $E_0$ ලක්ෂයෙන් දැක්වේ. එහිදී සමතුලිත මිල $P_0$ ද සමතුලිත ප්‍රමාණය $Q_0$ ද වේ. ගැනුම්කරු මත ඒකක බද්ද පැනවීමෙන් පසු නව සමතුලිතය $E_1$ ලක්ෂයෙන් දැක්වේ. එහි දී සමතුලිත මිල $P_1$ ද සමතුලිත ප්‍රමාණය $Q_1$ ද වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura